
# තෙල් අවුරුද්ද පිළිබඳ විමසුමක්

**නාලක ජයසේන**

**හැඳින්වීම**

සිංහල බෞද්ධ ජනතාවගේ මහාමංගල්‍ය වන, ජ්‍යෝතිර්විද්‍යාත්මක ව හිරු දෙවියා හෙවත් සූර්යයා (රවි ග්‍රහයා) මීන (රේවත නැකත) රාශියේ සිට මේෂ (අස්විද නැකැත) රාශිය දක්වා ගමන් ගැනීම පදනම් කරගෙන සමරනු ලබන සිංහල අවුරුදු උලෙළ සෑම වර්ෂයක ම අප්‍රේල් හෙවත් සිංහල මාස ක්‍රමය ප්‍රකාර ව බක් මස පැවැත්වෙයි. සිංහල අවුරුද්ද සංවිධානයක් වශයෙන් ගත්කල අංග චතුර්ථයකින් සමන්විත වෙයි.

1. පරණ අවුරුද්ද
2. නොනගතය
3. අලුත් අවුරුද්ද
4. තෙල් අවුරුද්ද




**Ns** - නොනගතයේ ආරම්භය　　**NE** - නොනගතයේ අවසානය

**D** - අවුරුදු උදාව　　**T** - සංක්‍රාන්තිය

**(මූලාශ්‍රය - නාලක ජයසේන 2019)**

එ නයින් බලන කල අවුරුදු උලෙළෙහි සංවිධානාත්මකභාවය මගින් සිංහල බෞද්ධ සංස්කෘතියේ විවිධ පුරුෂාර්ථ නිරූපණය විය. ගෙවී යන වර්ෂයට සමු දී නව නිෂ්පාදන වර්ෂයක් ආරම්භ කරද්දී පරණ වන නැත්නම් සමුදෙන අවුරුද්දේ අවසන නෙළා ගත් අස්වැන්න බුදුන්ට දෙවියන්ට පුදමින්, ගෙවුණු වසරේ සශ්‍රීකත්වයට කෘතගුණ දැක්වීම සිදු කරන, අලුත් සහල් මංගල්‍යය සමඟ පරණ අවුරුද්ද ආරම්භ වෙයි. නමුත් අදවන විට අවුරුදු සැමරුම අප්‍රේල් 13 හා 14 දෙදින යෙදුණ සතියට පමණක් සීමා වී තිබේ. කෙසේ නමුත් මෙම අවුරුද්දෙහි සතුට සමඟ ස්වස්ථතාවට දී ඇති ආස්ථානය ඉතාම වැදගත්ය. අවුරුදු චාරිත්‍ර රාශියක නිරෝගීත්වය සහ සෞඛ්‍යවත්බව සංකේතවත් වෙයි. එහි උච්ඡතම අවස්ථාව වන්නේ හිසතෙල් ගෑමේ මහෝත්සවය යි. අවුරුදු සැමරුම ආරම්භ කරන සිරිත්වල පටන් අවසන් වන සිරිත දක්වාම රැඳී ඇති මෙම නිරෝගීත්වයේ සහලක්ෂණය හේතුවෙන් අවුරුදු සමරන ජනතාවගේ කාය චිත්ත ශක්තිය හා සෞඛ්‍ය අභිවර්ධනය වෙයි. සිංහල අවුරුද්ද ජාතික උත්සවයක් ද (ශ්‍රී ලාංකික ජාතිය යන අරුතෙන්) නැද්ද යන්න විවාදාපන්න තේමාවක් වුව ද මෙම චාරිත්‍රය ජාති හා ආගම් භේදයකින් තොර සමාජවිද්‍යාත්මක වටිනාකමක් ඇති චාරිත්‍රයක් ලෙස දැක්වීමට හැකි ය.

## කාය චිත්ත ශක්තිය වර්ධනය කරන අවුරුදු සිරිත් විරිත්

පරිසරය සමඟ අවුරුද්ද සමරන ජනතාවගේ සිත ගත අලුත් වීමක් නැවුම් වීමක් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය මගින් සිදුවෙයි. වර්තමානයේ අභාවයට ගිය ද සිංහල අවුරුද්ද අතීත ගැමියා ආරම්භ කරන ලද්දේ අත්තම් සම්ප්‍රදාය සමඟිනි. සිංහල අවුරුදු සැමරුම ආරම්භ වන්නේ අවුරුදු අත්තම්, කෝණ අත්තම් හෙවත් බක්මහ අත්තම්වලිනි. අත්තම් හෙවත් සේවා හුවමාරුව ඔස්සේ අවුරුද්දට අදාළ චාරිත්‍ර වාරිත්‍රවලට සූදානම් වීම අතීත ගම්වාසීහු සිදු කළහ. අත්තම් ක්‍රමයට හෙවත් සාමූහික ශ්‍රම දායකත්වයෙන් එසේ සිදු කළ අත්තම් අතර, වැවේ කෝණම් කට්ටි කැපීමේ අත්තම (වැවේ රොන් මඩ ඉවත් කිරීම) කැවිලි අත්තම (සාමූහික ව විවිධ කැවිලි වර්ග තැනීම), කෝණ පින් අත්තම (ගමේ පන්සල සුද්ධ පවිත්‍ර කිරීම) ආදිය ද වෙයි. අත්තම් ක්‍රමය සිංහල සංස්කෘතියේ අංගයක් වූ බව පහත කවියෙන් ද පැහැදිලි වෙයි.

උදයම අවදි වී හේනට හෝ කෙතට
ඇදුනලු මැලිනොවී වැඩිහිටි අය පෙළට
ඇත්තම් කියා සමඟිව වැඩකර එකට
එකපත බෙදාගෙන කෑවලු උන් එකට

අවුරුද්ද සම්බන්ධ මෙම අත්තම්වලින් සිදුවූ විශේෂ කර්තව්‍යයක් වන්නේ කායික නිරෝගීත්වයට අදාළ ව්‍යායාම සහ ක්‍රියා පිළිවෙත් ඉබේ ම ඉටු වීම යි. අද මෙන් ශරීර සෞඛ්‍ය පවත්වා ගැනීමට ජිම් හා ජොගින්/වෝකින්ග් යෑමේ ඊනියා සංස්කෘතියක් එ කල නො තිබුණු අතර, පෘෂ්ටිමත් ජාතියක නිරෝගීත්වය සඳහා මෙ වැනි සංස්කෘතික ක්‍රියා කාරකම් මැනැවින් දායක විය. ඒ අනුව අවුරුදු සැමරුමේ

ආරම්භයම කය නිරෝගී කරමින් අතපය වෙහෙසවමින් සිදු කළ සාමූහික මානව ක්‍රියා කාරකමකි. මෙසේ කය සමනය කරමින් ආරම්භ කළ අවුරුදු සැමරුමේ අවසානය ද කය සමඟ මනස ද සමනය කරන හිසතෙල් ගෑමෙන් සිදු විය.

## හිසතෙල් ගෑම

අප්‍රේල් මස 19 වැනි සෙනසුරාදා දින පූර්ව භාග 07.16 ට දකුණු දිශාව බලා හිසට නුග පත් ද පයට කරඳ පත් ද තබා නිල් පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී නුග පත් යුෂ මිශ්‍ර නානු ද තෙල් ද ගා ස්නානය කරනු මැනවි.

සෑම වර්ෂයක ම පාහේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නැකත් කමිටුව රැස් ව එළඹෙන වසරට අදාළ අවුරුදු නැකත් සාදනු ලැබේ. අනතුරු ව පුරාණ පෙර රජදවස සිහිකොට සෑම වසරක ම අප්‍රේල් මස මුල දී රටේ නායකයා වන ජනාධිපතිවරයාට නැකත් සීට්ටුව පිළිගැන්වීම සංස්කෘතික අමාත්‍යාංශයට විසින් සිදු කරනු ලැබේ. 2021 වසරේ දී ජනාධිපතිවරයාට පිළිගන්වන ලද නැකැත් සීට්ටුවේ හිසතෙල් ගෑමේ නැකත දැක්වෙන්නේ ඉහත පරිදි ය.

හිසතෙල් ගෑමේ අවුරුදු චාරිත්‍රය, කෝණ තෙල් ඇඹුල් මංගල්‍යය ලෙසත් ඉස්සෝදා නාන අවුරුද්ද ලෙසත් හැඳින්වෙයි. පෙරදිග වෛද්‍ය ශාස්ත්‍රය අනුව සිරුරේ වා, පිත්, සෙම් සමතුලිත නො වීමෙන් රෝගාබාධ හටගනියි. කායික පමණක් නො ව මානසික සැපතට ද ඒවා සමතුලිත විය යුතු ය. එසේ නො වුණොත් ඒ සලකන්නේ තුන්දොස් කිපීමක් වශයෙනි. තෙල් අවුරුද්දේ ස්නානය හා නානුගැල්වීම හිස කේන්ද්‍ර කොට ගෙන සිදු කරයි. හිස යන්න ශාරීරික සේ ම මානසික ක්‍රියාකාරීත්වයට ද ඉතාම වැදගත් ශරීරාංගයකි. හිසෙන් පටන් ගෙන කන්වල ද පසු ව සිරුරේද පිළිවෙළින් තෙල්ගැල්විය යුතු බව ආයුර්වේද වෛද්‍ය නිර්දේශය යි. හිසතෙල් ගැල්වීමේ චාරිත්‍රය මගින් අපේක්ෂා කරනුයේ නව වසර පුරා යහ සෞඛ්‍යයක් පවත්වා ගැනීම යි. හිසතෙල් ගැල්වීම සිදු කරන්නේ ආධ්‍යාත්මික ආශීර්වාදයක් ද සහිත ව බැවින් කයෙන් ඔබ්බට ගොස් මනෝමය කය හෙවත් ආධ්‍යාත්මික කය කෙරෙහි ද එම ශක්තිය බලපවත්වනු ඇත. හිසතෙල් ගැල්වීම පිළිබඳ ආයුර්වේද මතය මෙසේ ය.

අෂ්ටාංගහෘදය නමැති ශ්‍රේෂ්ඨ ආයුර්වේද ග්‍රන්ථය රචනා කළ වාග්භට ආචාර්යවරයා මිනිස් සිරුර දකිනුයේ කෙසේ ද? යටිකුරු කළ ගසක් හැටියට යි. 'ඌර්ධ්ව මූලං අධං ශාඛා' යන වාග්භට මතයට අනුකූල ව අපගේ ශරීරයේ මුදුන්මුල පිහිටා ඇත්තේ හිසේ ය. එහි ශාඛා ප්‍රශාඛා පහළට විහිදී ඇත. එ බැවින් මිනිසා නමැති ගස මැනැවින් වැඩෙන්නට නම් එහි මුදුන් මුලට උත්තමාංගයට හෙවත් හිසට සාරවත් පොහොරක් දිනපතා යෙදිය යුතු නොවේ ද ? හිස අපේ උතුම්ම අංගය යි. උත්තමාංගය යනු එහෙයින් යෙදේ. මුළු මහත් සිරුර පාලනය වනුයේ හිස්කබල තුළ පිහිටි මොළයේ මහිමයෙනි. වෙනත් විධියකින් කිවහොත් මිනිස් සිරුරේ සියලු පණනල රැකී ඇත්තේ මොළය හෙවත් මස්තිෂ්කය මුල්කොට පවත්නා ස්නායු පද්ධතියෙනි. එමතු ද? සිරුර අසිරිමත් නිමැවුමක් බව පත්කළ පසිඳුරෝ ද හිසට අයත් වෙති. **(පොන්නම්පෙරුම 2007).**

හිසතෙල් ගෑමට සිදු කළ නානුමුර මංගල්‍යය අතීතයේ දී රජුගේ මූලිකත්වයෙන් පැවැත්වී ඇත. එම සම්ප්‍රදායට ගරු කරමින් අදටත් එම මංගල්‍යය සිදුවන්නේ රටේ නායකයාගේ මූලිකත්වයෙනි. ඒ අනුව තෝරාගත් රජමහා විහාරයක දී රාජ්‍ය නායකයාගේ සම්ප්‍රාප්තියෙන් රාජ්‍ය හිසතෙල් ගෑමේ අවුරුදු උත්සවය සිදු කරනු ලබන අතර එය මාධ්‍ය මගින් ද විකාශනය කරයි. එමගින් සංකේතවත් වන්නේ සමස්ත ජාතියේ ම නිරෝගීත්වය යි. තවද රටේ ජනතාවගේ සෞඛ්‍ය කෙරේ පාලකයාගේ වගකීම හා වගවීම ද එ මගින් අර්ථවත් වෙයි. එසේ ම කායික නිරෝගීත්වයෙන් ඔබ්බට ගොස් මානසික සංහිඳියාව ඇති කරමින් ඉදිරි වර්ෂයට අවශ්‍ය චිත්ත ධෛර්ය මෙහි දී ලැබෙනු ඇත. එසේ ම ඒ අවස්ථාවේ සිදු කරනු ලබන කාව්‍යමය ප්‍රාර්ථනා සලකන විට අභව්‍ය හෙවත් විය නො හැකි දෙයක් සිදු වන ලෙස අදිටන් කිරීමෙන් හිසතෙල් ගෑමේ මහෝත්සවය විශ්වාසය සහ මනෝමය අභිප්‍රේරණය ජනිත කරයි. ප්‍රාදේශීය විසමතා සහිත පහත කවිය ඊට නිදසුන් ය.

කළු කපුටා සුදු වන තුරු - ගැරඬියාට අං එනතුරු  
මෝල්ගහේ දළුලන තුරු - එකසිය විස්සට දෙසිය විස්සක් ආවඩා  
ආයු බෝ වේවා

ආශීර්වාදාත්මක සෙත් පිරිත්වලට අමතරව විවිධ ස්ථානවල වෙනස් වන ස්තෝත්‍ර හා සැහැලි හිසතෙල් ගෑමේදී කියනු ලැබේ. හිසතෙල් ගැල්වීමෙන් පසු පිරිත් නූල් බැඳීම ද සිදුවෙයි.

සර්වදේව නමස්කෘත්වා  
සර්වරෝග හරම් පරම්  
සර්වකාර්ය සදා නිත්‍යම්  
කුර්වන්තු තෙ මංගලම්  
බෝවා දහසක් ආයු වඩන්නයි  
යසසිරු සම්පත් ලාබ කරන්නයි  
සිරස ගතේ රෝ නියෙන් බසින්නයි  
සියලු දෙවියො රැකවරණය සලසන්නයි  
**(ලොකුහේවා 2017)**

එසේම පහත දැක්වෙන ගාථාද සජ්ඣායනා කරනු ලැබෙයි. ඒවායේ අර්ථය ද නිරෝගීත්වය හා රැකවරණය යි.

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා  
සචිත්ත පරියෝ දපනං - ඒතං බුද්ධාන සාසනං

සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බරෝගෝ විනස්සතු  
මාතෙ භවත්වන්තරායො -සුඛී දීඝායුබො භව

හවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානු භාවේන - සදා සොත්ථි භවන්තුතෙ

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං

මෙහි දී හිසතෙල් ගෑම සඳහා යොදාගනු ලබන ඖෂධවල ගුණාගුණ විමසා බලන විට ඒවා සොබාදහමෙන් ලබාගත හැකි අනගි දායාද වශයෙන් සැලකිය හැකි ය. ඖෂුතුරුවලින් ලබාගන්නා මුල්, මල්, පොතු, ගෙඩි, ඇට, යුෂ, කිරි ඈ විවිධ දෑ අවුරුද්ද පුරා ම අනේකවිධ රෝගාබාධ සඳහා යොදා ගැනෙයි. අවුරුදු නානු පිළියෙළීකරණයට ගන්නා ඔසු ඒවායේ හරස්කඩකි. ඖෂධ ද්‍රව්‍ය එක්කොට චූර්ණ කිරීම එහි ලා පළමු ව සිදු කරයි. පසු ව ඊට එක්කරන කොළ වර්ග අමුකහ සහ සම ප්‍රමාණ කොටා එහි යුෂ ඊට එක් කරයි. එසේ සකසන නානු සමග නීලාාදි වැනි බෙහෙත් තෙලක් හෝ තල, මී, අබ, කොහොඹ සහ එඬරු යන පස්තෙල් ද එක් කරමින් හිසේ ගෑමට තෙල් මිශ්‍රණය සකසනු ලැබෙයි. හිසතෙල් ගෑම යෙදෙන දින ප්‍රකාර ව හිසට හා පයට කොළ තැබීම ද සිදු කරයි. ජ්‍යෝතිර්විද්‍යාත්මක ව ඒ ඒ දිනට අදාළ ග්‍රහයාගේ කොළ වර්ගය පයට ද ඊට පෙර දිනට අධිපති ග්‍රහයාගේ කොළ වර්ගය හිසට ද තබයි. (බෝ කොළ පමණක් පයට නො තබයි). හිසට තෙල්ග ෑම කරනුයේ බුලත් කොළයක් යොදාගෙන ය.

| දිනය | ග්‍රහයා | ශාකපත්‍ර | පැහැය |
|---|---|---|---|
| ඉරුදා | සූර්යයා (රවි) | ඉඹුල් | තඹ |
| සඳුදා | චන්ද්‍රයා (සඳු) | දිවුල් | සුදු |
| අඟහරුවාදා | කුජ | කොළොන් | රතු |
| බදාදා | බුධ | කොහොඹ | කොළ |
| බ්‍රහස්පතින්දා | බ්‍රහස්පති | බෝ | රන්වන් |
| සිකුරාදා | සිකුරු | කරඳ | මිශ්‍ර |
| සෙනසුරාදා | සෙනසුරු | නුග | නිල් |

**(නාලක ජයසේන, 2019).**

තෙල් හා නානු සාදා ගැනීමට යොදා ගන්නා ඖෂධ කිහිපයක් හා ඒවායේ ගුණ පහත පරිදි ය.

කලාඳුරු අල - සෙම් දොස් සමනය කරයි

කුංකුම්පු - මල බද්ධය දුරලයි

විෂ්ණුක්‍රාන්ති - උමතු විකාර දොස්හරණය කරයි

නස්නාරං මුල් - අජීර්ණ දොස් නැති කරයි

සස්සඳ මුල් - අරුචිය වමනය නැති කරයි

ගෝරෝචන - සිරුර සිසිල් කරයි

ඉරිවේරිය - අතීසාරය වළකයි

නෙළුම් දඬු - වාත සෙම්හරණය කරයි

සැවැන්දරා මුල් - දාදිය දුගඳ නැති කරයි

වෙනිවැල් ගැට - සෙම් දොස් හරියි

ගොඩමානෙල් මුල් - බඩගිනි වඩයි

ඉරමුසු මුල් - උණට සහනය දෙයි

සුදු හඳුන් - මුත්‍ර පිරිසිදු කරයි

බෙලි මුල් - උදරාබාධ සුව කරයි

නානු යන්න ක්‍රියාවක් සේ සලකන විට ස්නාන (නාන්න) යන විධානාර්ථය ද නාමයක් ලෙස සලකන කල මැලියම් යන අදහස ද ලැබෙන අතර, තෙල් යන සංස්කෘත වදන ස්නේහ යන්නෙන් තැනී ඇත. එම ස්නේහ යන්නෙන් සෙනෙහස යන්න ද අර්ථවත් වෙයි.



හිසතෙල් ගෑමට සැකසූ තෙල් හා නානු **(මූලාශ්‍රය - අන්තර්ජාලය).**

හිස තෙල් ගෑමේ සිරිතට අදාළ මූලික කටයුතු අතීතයේ පන්සල කේන්ද්‍ර කොට ගෙන ආරම්භ වන්නේ නොනගතය සමයේ දී ය. අවුරුදු පිරිත, නොනගත හෙවත් පුණ්‍ය කාලයේ පූර්වභාගයේ දී පන්සලේ ස්වාමීන් වහන්සේලා විසින් සජ්ඣායනා කිරීම දැකිය හැකිය. එම පිරිත් පැන් හා නූල් බෙදා දීම සිදු කළේ හිසතෙල් ගාන දිනයේ වන අතර ඇතැම් පන්සල්වල පිරිත් පැන් ස්වල්පයක් නානුවලට එක් කිරීම ද දැකිය හැකි ය. **(නාලක ජයසේන, 2019).**

හිසතෙල් ගෑමේ නැකතට කණ්ණාඩික් ඉදිරියේ බුදු පිළිමයක් තබා එහි හිසේ ඡායාවේ තෙල් ගැල්වීමෙන් බුදු පිළිමයේ හිසතෙල් ගෑමේ සිරිතක් ද එදා තිබී ඇත. තවද ඇතැම් පෙදෙස්හි දේවරූපවල ද හිසතෙල් ගැල්වීම සිදු කරයි. නානුමුර හේවිසිය මෙම නැකතට පෙර පන්සල්වල සිදු කෙරිණ. අද වන විට මේ සිරිත් අභාවයට යමින් පවතියි. මේ අනුව හිසතෙල් ගෑමේ සිරිත සමග තිබුණු අතීත චාරිත්‍ර රාශියක් අද වන විට අභාවයට ගොස් ඇති බව පැහැදිලි ය.

නානු හා හිසතෙල් ගෑමෙන් පසු ව ස්නානය සිරිත යි. අවුරුද්දට ස්නානය අවස්ථා දෙකක දී සිදු කරතත් හිසතෙල් ගා ස්නානය කරනුයේ මේ අවස්ථාවේ පමණි. අතීතයේ සාමූහිකව ඇළ දොළ හා වැව්වල එම චාරිත්‍රය ඉටු කළද අද වන විට ළිං ද අභාවයට ගොස් නිවස තුළ ම සැකසුණු නානකාමරවල එම චාරිත්‍රය ඉටු කරන්නට සිදුව ඇත. ස්නානය මගින් ද සිරුර පිරිසිදු හා සැහැල්ලු වී ප්‍රාණවත් වෙයි. එය ද නිරෝගීත්වයට අවශ්‍ය වෙයි. අනෙක් අතට අවුරුද්ද යෙදෙන සමය ග්‍රීෂ්ම බැවින් ස්නානය මගින් ගත සිසිලනය වන්නේ ය. අතීතයේ ස්නානය කිරීම සාමූහික ව ඇළ දොළ අසල සිදු කළ අතර අද වන විට එය ද අභාවයට යමින් පවතියි.

ඇතැම් ප්‍රදේශවල සිංහල අවුරුදු උත්සව පවත්වන්නේ හිසතෙල් ගෑමේ උත්සවය යෙදෙන දින දී ම ය. එසේ ම ඇතැම් ප්‍රදේශවල අවුරුද්දට හැදී කෑම හෙවත් ඉස්සෝදා නාන අවුරුදු මංගල්‍යය සිදු කළේ ද හිසතෙල් ගැල්වීමෙන් පසුව ය. ඒ අනුව ගමරාලගේ නිවසේ හෝ පවුල්වල මහගෙදරට එකතු වන නෑසිය පිරිවර එක් ව ආහාර පාන හා අවුරුදු කැවිලි පෙවිලි භුක්ති විඳ තෑගි භෝග හුවමාරු කිරීමත් වැඩිහිටි ආශීර්වාද ගැනීමත් ඇතැම් විට ගං කහලි, බිං කහලි හා මඟුල් කහලි ලෙස හැඳින්වූ පවුල සම්බන්ධ ඉඩකඩම් හා ආවාහ විවාහ තීන්දු ගැනීම ද මේ සමඟ සිදු කොට ඇත.

## අතීතයේ හිසතෙල් ගෑමේ උලෙළ

අතීත රජදවස හිසතෙල් ගෑමේ උළෙල අවුරුදු සැමරුමේ සුවිශේෂාංගයක් ව ඇත. මහනුවර යුගයේ ආහාර අනුභවය හා වැඩ ඇල්ලීමට පෙර හිස තෙල් ගෑමේ මංගල්‍යය සිදුව තිබීම සහ අදවන විට එය එම චාරිත්‍රවලට පසු ව සිදු කිරීමද අවුරුද්දේ පරිණාමය සලකන කල සුවිශේෂ සංසිද්ධියකි. ජෝන් ඩේවි තම දිනපොතේ එය මෙසේ දක්වයි.

## 1815 අප්‍රේල් 10

පහට මඟුල් මඩුවේදි අදිකාරම්වරු දෙදෙනා හමු වූයෙමි. හෙට රජ මාලිගයේ පැවැත්වීමට නියමිත සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර ඉටුකිරීමට අදාළ කටයුතු සූදානම් කළෙමි. රාත්‍රී නවයට නාථ දේවාලයට ගොස් පැය භාගයක් එහි ගත කළෙමි. අදිකාරම්වරු ඇතුළු සෙසු ප්‍රභූහු එහි ඖෂධීය ශාකසාර (නානු) පිළියෙල කළහ.

ඒවා මැටි බඳුන්වල බහා හෙට දිනයේ පාවිච්චි කරනු පිණිස මහනුවර සහ සෙසු ප්‍රදේශවල විහාරස්ථානවලට සහ අදිකාරම්වලට යවන ලදි

## 1815 අප්‍රේල් 11 දින

එස්වරු 6.30 ට ඇහැලේපොළ නිලමේ මඟුල් මඩුවට සැපත් විය. ඉන්පසුව අදිකරම් දෙදෙනා සහ සෙසු ප්‍රභූහුද එහි ආහ. නොනගතය පෑ තැටියෙන් බලා ප්‍රකාශ කරන ලද්දේ නක්ෂත්‍රයා විසිනි. නැකැත් වේලාව ඇරඹිණි. නාථ දේවාලයේ හේවිසි නාද කෙරිණ. දිසාවකට දෙක ගණනේ කොඩි තුවක්කු වෙඩිමුර අටක් ද තබන ලදි. නැකැත උදාවත්ම ප්‍රභූ පවුල්වලින් රුවැති යුවතියෝ දල්වාගත් පන්දම් සහ සහල්වලින් සහ කහදියරවලින් යුතු තැටිය බැගින් ගෙන රජතුමාට නොදුරින් සිටියහ. නැකත උදාවත් ම රජතුමා හිසෙහි නානු ගල්වා ගත් අතර එම යුවතියෝ අපේ රජ්ජුරුවන් වහන්සේට පස්වාන් දහසක් ඉර හඳ බවතිනා කල් ආයුබෝ වේවායි තෙවරක් ම සුබ පැතූහ.

ඉහත සාක්ෂ්‍යවලින් ද පැහැදිලි වන පරිදි මෙම චාරිත්‍රය අතීතයේ ඉටු වී ඇත්තේ මහනුවර නාථ දේවාලය කේන්ද්‍ර කරගෙන ය. ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් උපුටා දක්වන පරිදි සෙනරත් පරණවිතාන දක්වා ඇත්තේ නුවර නාථ දේවාලයේ අවුරුදු නානු තනන උත්සවයේ දී නානු කළ දහසක් සෑදීම රාජකීය වෛද්‍යවරුන්ට නියම වූ අතර ඒවා වසා මුද්‍රා තබා රජගෙදරට හා අනෙකුත් විහාරස්ථානවලට උත්සවශ්‍රීයෙන් බෙදා දුන් බව යි. එ ලෙස බෙදා දුන් දේවාලය හා විහාරස්ථාන 64ක් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වා ඇත. නමුත් විවිධ වර්ෂවල එම සංඛ්‍යාව වෙනස් ව ඇති බව මීගස්කුඹුර දක්වයි (හෝල්ට් 1994, පරි. මීගස්කුඹුර)

තවද එහි දැක්වෙන පරිදි නානු කොටස් වශයෙන් බෙදීමේ දී ඒ ඒ දෙවිවරුන්ට මෙසේ වෙන් ව ඇත. නාථ දෙවි - කොටස් 11, විෂ්ණු දෙවි - කොටස් 08, පත්තිනි දෙවි - කොටස් 08, දේවතා බණ්ඩාර (දැඩිමුණ්ඩ දෙවි) - කොටස් 08, කතරගම දෙවි - කොටස් 04, පිටියේ දෙවි - කොටස් 03, සමන් දෙවි කොටස් - 01, ගණ දෙවි - කොටස් 01. මෙම සම්ප්‍රදාය පෙරදැරි ව අදටත් නාථ දේවාලයේ දී ඖෂධීය නානු බෙදාහැරීම අලුත් අවුරුදු උදාවට පෙර සිදු කෙරේ. එපමණක් නො ව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් නානු කුඩු පැකට් සාදා රටපුරා බෙදා හැරීම අවුරුද්දට පෙර සිදු වන අතර සෑම විහාරස්ථානයකට ම හා ආයුර්වේද ලියාපදිංචි වෛද්‍යවරුන්ට පාහේ ඒවා යවනු දැකිය හැකි ය.

අතීතයේ දී රාජකීය දෛවඥයාගේ මූලිකත්වයෙන් හිසතෙල් ගෑම සිදු කර ඇති අතර අද ඒ සඳහා පන්සලේ දී නම් නායක ස්වාමීන් වහන්සේත් , වෙදගෙදර නම් වෙදමහතාත්, නිවසේ දී නම් පවුලේ ප්‍රධානියා හෝ පවුලේ සිටින වැඩිහිටි ම පුද්ගලයා අතින් එය සිදු වෙයි. මෙ නයින් ගත්කල සමාජ සම්බන්ධතාවල සිංහල බෞද්ධ සමාජයේ නිරූපිත පූජනීයත්වයට හා වැඩිහිටිත්වයට සැලකීම ද මෙම චාරිත්‍රය ඔස්සේ විශද වෙයි.

## සමෝධානය

සිංහල අලුත් අවුරුද්ද ලිප්ගල් තුනක් මත ඉදෙන බතක් මෙනි. එහි ලිප්ගල් තුන නම් ආයුර්වේදය, ජ්‍යෝතිර්වේදය හා බුදු දහම යි. සිංහලාවුරුද්දේ අවසන් මහා චාරිත්‍රය වන හිසතෙල් ගෑම තුළ මෙම විෂයපථයේ මනා නියෝජනයක් හා සංකලනයක් මැනැවින් දැකගත හැකි ය. එ පමණක් නො ව එහි ඇති වෛද්‍යවිද්‍යාත්මක සහ සමාජවිද්‍යාත්මක අගය ද තවදුරටත් හැදෑරිය හැකි සහ හැදෑරිය යුතු ය. සිංහල සංස්කෘතියේ පාදම බඳු සිංහල අලුත් අවුරුද්දෙහි නිරෝගීත්වය සහබද්ධ මහාචාරිත්‍රය වශයෙන් හිසතෙල් ගෑමේ චාරිත්‍රය හෙවත් තෙල් අවුරුද්ද මෙ නයින් හඳුනා ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


තෙන්නකෝන්, ජයතිස්ස. (2015). **රුහුණු අලුත් අවුරුදු සිරිත් විරිත්**, කොළඹ 10  :ගොඩගේ.

ද සිල්වා , නලින්. (2014) **සිංහල අවුරුද්ද**, බොරැල්ල : විසිදුනු .

නාලක ජයසේන. (2019) **සිංහල අවුරුදු ජනවහර**, කොළඹ 10 :ගොඩගේ.

පොන්නම්පෙරුම අමරසිරි (2007 අප්‍රේල් 15) **හිසතෙල් ගෑමේ චාරිත්‍රයෙන් ඉස්මතු වන්නේ හිසට සැලකීමේ අගයයි** : ඉරිදා ලක්බිම

මීගස්කුඹුර, පී.බී. (1994) **මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය** (පරි), කොළඹ 12: ප්‍රදීප.

රාජපක්ෂ , එස්.එම් .ඩබ්ලිවු .(2013). **අවුරුදු සිරිත් විරිත්**, කොළඹ 10: ගොඩගේ.

ලොකුහේවා, සඳරුවන්. (2017) **සිංහල අලුත් අවුරුද්ද**, කොළඹ 10: ගොඩගේ.

සෝමරත්න, ඇල්ලේපොළ. (2008) **ඩේවි දුටු ලංකාව** (අනු), විසුදුනු: බොරලැස්ගමුව.